හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර, ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන ගිණුම් ආශ්‍රිත සුවිශේෂ පැකේජ සහිත විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් මතු සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්ම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඩු ලිඛිත ප්‍රකාශයක් අප බැංකුවේ ;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ දුරකථන අංක **[+94(0)11 4711411]** ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපැලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්ෂණිකව ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තරය | බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන වාසි | ගාස්තු වර්ග සහ බැංකුව විසින් පනවන වෙනත් අයකිරීම් | ගිණුම විවෘත කිරීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **කාලීන තැන්පතුව** | | | | |
| **නේෂන්ස් රයිස් ඩිපොසිට් (Nations RI$E Deposit USD)** | පළමු සහ දෙවන වසර දෙකෙහිම පොලී අනුපාත වාපිරිකව 6% ලෙස ස්ථාවර වේ.<br><br>පාරිභෝගිකයින්ට දැන් වෙළඳපොල පොලී අනුපාත උච්චාවචනයන්ගෙන්/අඩු වැඩි වීමේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව ඇති අතර. ඔවුන්ට 90% දක්වා ණයක් හෝ අයිරා විකල්පයක් සමගින් තැන්පතුවට එරෙහිව ණය ලබා ගත හැකිය. | ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාම සඳහා බැංකු ගාස්තු අය නොකෙරේ.<br><br>ආයතන වෙබ් අඩවියේ පළකරන බැංකු ටැරිෆ් ගාස්තු අනුව ලබාගන්නා යම් අතිරේක සේවාවන් සඳහා සම්මත අයකිරීම් අදාළ වේ. | කාලීන තැන්පතුවක් සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය හැකිය<br><br>■ ජාතික හැඳුනුම්පතේ (NIC)/ වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>■ පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ.<br><br>■ නියාමන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු විවෘත කිරීම පිණිස නියාමක විසින් නියම කරන යම් අතිරේක ලේඛන. | යෝග්‍යතා නිර්ණායක:<br><br>■ PFC RFC ඝණය<br>ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන තැනැත්තෙකු - ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත තැනැත්තෙකු<br><br>■ PFC NRFC ඝණය<br>ශ්‍රී ලංකාවෙන් බැහැරව පදිංචිව සිටින, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත තැනැත්තෙකු<br><br>■ BFC (FEEA EFC) ඍජු අපනයන ඝණය<br><br>පදිංචි තැනැත්තන්<br><br>ශ්‍රී ලංකාවේ ලියාපදිංචි තනි හිමිකාර ව්‍යාපාරය හෝ හවුල් ව්‍යාපාරය<br><br>ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගමක්<br><br>2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශ සමාගමක් වශයෙන් ලියාපදිංචි කර තිබෙන, ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත සමාගමක්<br><br>අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ නිසි බලධරයාගේ නිර්දේශ සහිතව රජයේ ආයතනයක්<br><br>**_*රාජ්‍ය නොවන ආයතනවලට විවෘත කිරීමට අවසර දෙනු නොලැබේ._**<br><br>කල්ඉකුත් වීමට පෙර සිදුකරන ආපසු ලබාගැනීම් සඳහා අදාළ වන දණ්ඩන පොලිය:<br><br>■ වසර 2 ට අඩු කාලසීමාවන් සඳහා පොලි අනුපාතය වන්නේ , අවසාන සම්පූණර් කරනලද කාලසීමාව සඳහා ලැබූ පොලි අනුපාතයෙන් 1.5% අඩු කල විට ලැබෙන පොලි |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සේවාදායක ණයන් පදනම් කරගෙන මනාප පොලියක් පිලිගන්වනු නොලැබේ.<br><br>• ස්ථාවර තැන්පතුව කල්පිරීම මත මුල් මුදල සහ පොලිය බැංකු ගණුදෙනුකරු විසින් ලිඛිතව නම්කරන ගිණුමකට පවරනු ලැබේ. (විදේශ විනිමය රෙගුලාසිවලට යටත්ව) |